*ඝැ. යු.* - 2014.07.11 දින පළ වූ අංක 1,871 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,872 - 2014 ජූලි මස 18 වැනි සිකුරාදා - 2014.07.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1188 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1188 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1192 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1198 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූලි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1187- B 80857- 2,875 (2014/07)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : SRS/F. 7079.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**මෝටර් ට්‍රොලි තුනක් (03) සැලසුම් කිරීම නිෂ්පාදනය කිරීම සැපයීම හා ක්‍රියාත්මක කොට පෙන්වීම**

ප්‍රසම්පාදන අංක : SRS/F 7079

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත මෝටර් ට්‍රොලි තුනක් (03) සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, සැපයීම හා ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකාව, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01 දරන ස්ථානයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිනිය විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා මෙයින් ඇරයුම් කරනු ලැබේ. ඇටෝර්නි බලය පවරනු ලැබූ පිළිගත් නියෝජිතයකු මගින් නිෂ්පාදකයින්ට තම ලංසු භාරදිය හැක.

02. 2014.08.05 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවන ශ්‍රී. ල. රු. දහදාහක් (රු. 10,000) ප්‍රසම්පාදන ගාස්තුව වශයෙන් ගෙවා 2014.06.23 වැනි දින සිට 2014.08.04 වැනි දින දක්වා ශ්‍රී ලංකා වේලාවෙන් පෙ. ව. 9.00 හා ප. ව. 3.00 අතර හැර, ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගන්නා ආකෘතිපත්‍ර මත සටහන් කරන ලද ලංසු ලියවිලි පමණක් භාරදිය යුතුයි. විදේශීය ලංසුකරුවන් ඉහත දැක්වෙන දිනයන්හි දී ශ්‍රී. ල. රුපියල් වටිනාකමින් රු. දස දහසක් (රු. 10,000) පරිවර්තනය කළ හැකි විදේශ මුදල් වර්ගයකින්, තම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන් වෙත ගෙවා ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය, මගින් ලංසු ලියවිලි භාරදෙන ලෙස, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි තැනට ආයාචනයක් කළ යුතුයි. ශ්‍රී ලංකා රුපියල් දස දහසක් (රු. 10,000) හෝ ඒ සමාන පරිවර්තනය කළ හැකි විදේශ මුදල් වර්ගය ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුව වේ.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 1 දරන ස්ථානයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ දී එම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙම අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් රැගෙන විත් පහත ලිපිනය වෙත භාරදිය යුතුයි.

සභාපතිනිය,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී, ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිමනත් තොරතුරු සඳහා කරුණාකර පහත ලිපිනය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ,
ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංක : 94 (11) 2432044
විද්‍යුත් තැපෑල : srs.slr@gmail.com
gmrslr@sltnet.lk
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපතිනිය,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය.

07-415

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2015 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2015 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2014 අගෝස්තු මස 11 වැනි දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි අතර නියමිත ආකෘතිපත්‍රයෙන් යුත් ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත උපලේඛනයෙහි දැක්වෙන පරිදි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය, සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතික ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැලකිළිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝර්මය සමග පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර දැමිය යුතු ය. තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීම සඳහා නියමිත වේලාව ඉක්මවීමට පෙර වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එහි සඳහන් වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට ටෙන්ඩර්කරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් 'ගෙවීම සඳහා යන්න' සටහන් කරන ලද චෙක්පතින් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට, කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දුවන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩර් පතක් කිහිපදෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, ඒවා 2014.10.09 වැනි දින පෙරවරු 10.30ට මෙම ස්ථානයේ දී විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. ටෙන්ඩ විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම්, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

අයි. කේ. ජී මුතුබණ්ඩා,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2014 ජූලි මස 01 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අංකය | රා තැබෑරුමේ නම | තැබෑරුම පිහිටු වියයුතු ස්ථානය | ටෙන්ඩර් භාරගන්නා දිනය හා අවසාන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|---|
| අංක 04 | හරස්බැද්ද | හරස්බැද්ද ග්‍රාමය තුළ | 2014.08.11 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 05 | පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | 2014.08.11 පෙ. ව. 10.30 | 5,000 |

07-608

---

**බේරුවල ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාසය**

2015 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලට යටත්ව 2015 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා බේරුවල ප්‍රාදේශීය ලේකම් තැන වන ම විසින් 2014.08.05 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රයේ සකස් විය යුතු අතර-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින්ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය. මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරනු ලබන ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත්කර ලබාගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සිය; සහ

*(ආ)* වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තැබූ ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ තැබෑරුම් අංකය හා නම සඳහන් කර ටෙන්ඩර් භාරගැනීම අවසන් කිරීමට ප්‍රථම බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

එසේ නැතහොත් ටෙන්ඩර් භාරගන්නා වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එසේ එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන් හි දී සියලුම ටෙන්ඩර්කරුවන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2.30 ට පෙර ප්‍රාදේශීය මහලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යටකී රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහායි ලකුණු කර චෙක්පතකින් හෝ මහජන බැංකුවෙහි හෝ ආරක්ෂිත චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2014.10.02 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

07. වැඩි විස්තර මෙම කාර්යලයෙන් විමසා දැනගත හැකිය.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2014 ක් වූ ජූලි මස 02 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *නැවත විකුණන වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01. | බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | අළුත්ගම උප කාර්යාලයේ සීමාව තුළ | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ රාත්‍රී 8.00 | 2,000 | 2014 අගෝස්තු 05 වැනි දින පෙ. ව. 10.30 | 2014 ඔක්තෝබර් 02 වැනි දින පෙ. ව. 10.30 දක්වා |

***සැලකිය යුතුයි.***- 2015 වර්ෂයට දැනට රා තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම් විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

07-580

---

**බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015 වර්ෂය

2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2014.08.01 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි ''අංකය හා නම'' ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2014.08.01 වැනි දින පෙරවරු 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2014.10.16 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00 ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිවේ.

පී. එස්. පී. අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම් *(වැ. බ.)*,
බදුල්ල.

2014 ජූලි මස 02 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

2015 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර "බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය"
2015.01.01 වැනි දින සිට 2015.12.31 වැනි දින දක්වා

**උපලේඛනය**

| | *තැබෑරුමේ නම සහ ලිපිනය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2014.08.01<br>පෙ.ව. 10.30 |

***නැවත විකුණන දිනය*** .- සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් 2014.10.16 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ.

07-606

# රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

සෙලාන් බැංකුව

**ලියාපදිංචි අංකය : පී ක්‍යූ 9**

*සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03*

සෙලාන් බැංකුව මගින් බලාත්මක කරන ලද 2012 අගෝස්තු මස 02 දිනැති වී. ඒ. පරණගම, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍ර අංක 65, 2014 ජුනි 11 වැනි දින සිට අවලංගු කරන ලද බව සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

එන්. එන්. නජුමුඩීන් මිය,
සමාගම් ලේකම්.

2014 ජුනි මස 27 වැනි දින.
07-393

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

හලාවත පදිංචි ඩබ්ලිව්. පී. දබරේරා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් කෙටුම්පත් කර වර්ෂ 2011.08.26 වැනි දින රෝමයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී අත්සන් තබා සහතික කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කටුනේරිය, පහළ කටුනේරිය අංක 189/4 හි පදිංචි දැනට VIA PIETROCASTELLI - 306, MESSINA, ITALY හේවාගීගනගේ චාමන් ප්‍රසන්න යන අය විසින් කටුනේරිය, පහළ කටුනේරිය, අංක 189/4 පදිංචි කටුනායකගේ සාගරිකා විජිත දර්ශනී පෙරේරා යන අය වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. මෙය 2011.09.13 වැනි දින ඩී. බී. අංක 2418 යටතේ 46/3007 දරන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

එච්. සී. ප්‍රසන්න.

2014 ජූලි මස 01 වැනි දින.

07-419/1

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

හලාවත පදිංචි ඩබ්ලිව්. පී. දබරේරා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් කෙටුම්පත් කර වර්ෂ 2012.04.11 දින රෝමයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී අත්සන් තබා සහතික කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කටුනේරිය පහළ කටුනේරිය අංක 189/4 හි පදිංචි දැනට VIA PIETROCASTELLI - 306, MESSINA, ITALY හේවාගීගනගේ චාමන් ප්‍රසන්න යන අය විසින් කටුනේරිය, පහළ කටුනේරිය, අංක 189/4 පදිංචි කටුනායකගේ සාගරිකා විජිත දර්ශනී පෙරේරා යන අය වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. මෙය 2012.06.11 වැනි දින ඩී. බී. අංක 1815 යටතේ 54/3769 දරන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

එච්. සී. ප්‍රසන්න.

2014 ජූලි මස 01 වැනි දින දී ය.

07-419/2

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි

නම : බීගල් ෆ්ලීට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
දිනය : 2014.05.09
ලි. ප. අංක : පී වී 98511
ලිපිනය : අංක 171, ධීන්ස් පාර, කොළඹ 10.

ඒ. ජී. එස්. කෝපර්රේට් ස්විසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-422

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2014.02.26 වැනි දින ලියා සහතික කළ අංක 51 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස මහරගම, ඉසිපතනාරාම පාර, අංක 77/3, යන ලිපිනයෙහි පදිංචි රන්ගොඩගේ බෙනට් මෙන්ඩිස් ගුණවර්ධන වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 50 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

07-441/1

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2014.02.26 වැනි දින ලියා සහතික කළ අංක 50 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස දෙහිවල, කලුබෝවිල, ඔෆ් සුනන්දාරාම පාර, හොස්පිටල් ටෙරස්, අංක 19/6 ඒ යන ලිපිනයෙහි පදිංචි චමින්ද්‍ර කිලිට්ටුව ගමගේ වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 50 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

07-441/2

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2014.01.20 වැනි දින ලියා සහතික කළ අංක 48 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, 9 වන පටුමග අංක 51/10 සී, යන ලිපිනයෙහි පදිංචි බුලත්වත්තේ වලව්වේ කිත්සිරි නිශාඩ් දිසානායක වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 48 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

07-441/3

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

දයා කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2013.05.16 වැනි දින ලියා සහතික කළ අංක 36 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස දෙහිවල, කලුබෝවිල, ඔෆ් සුනන්දාරාම පාර, හොස්පිටල් ටෙරස්, අංක 19/6ඒ යන ලිපිනයෙහි පදිංචි චමින්ද්‍ර කිලිට්ටුව ගමගේ වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 36 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලු දෙනා වෙත මෙයින් දන්වමු.

07-442

### ඇටර්නි බලය අවලංගු කිරීම

මල්වාන පහළ මාපිටිගම අංක 11 හි පදිංචි සේනාධීරගේ ජයන්ත කුමාර රාජපක්ෂ වන මා සිය ඇටෝර්නි බලකරු ලෙස පත් කරමින් කොස්වත්ත තුලාවල කැළණිවිලා හි පදිංචි ඇලෙක්සැන්ඩර් රේමතුංග යන අය විසින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් වන චන්දිමා ජීවනී වෙල්ගම විසින් වර්ෂ 2011 ජනවාරි මස 28 හා අංක 958 යටතේ ලියා සහතික කරන ලද සහ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 46 වන කාණ්ඩයේ 43 වන පත් ඉරුවේ දිනපොත් අංක 1328 යටතේ වර්ෂ 2011.02.11 වැනි දින ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය බලරහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර මින් පසුව මා විසින් මාගේ ඇටෝර්නි අධිපති වෙනුවෙන් කිසිදු ක්‍රියාවක් නොකරන අතර ඔහු වෙනුවෙන් මා වග නොකියන බව ද උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

07-443

---

### ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 10, ඩීන්ස් පාර, අංක 266/4 හි පදිංචි පෙත්තා වඩුගේ සුහාන් සුසන්ත ද සිල්වා වන මා විසින් කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 224 හි පදිංචි බාලක්‍රිෂ්ණන් ශශි කුමාර යන අය වෙත බලය පැවරූ අංක 242 හා 2013 ජනවාරි මස 28 වැනි දින දිලුක්ෂි ශානිකා විජේසිංහ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ විශේෂ ඇටොර්නි බලය මෙයින් අවලංගු කරනු ලැබේ.

එකී බාලක්‍රිෂ්ණන් ශශි කුමාර යන අය විසින් එළැඹෙන කිසිදු ගණුදෙනුවකට මා විසින් මෙදින සිට වගකියනු නොලැබේ.

පෙත්තා වඩුගේ සුහාන් සුසන්ත ද සිල්වා.

07-444

---

### වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : විටාවෙල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 99045
සංස්ථාගත කිරීමේ දිනය : 2014.06.10
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 15/10 යූ, ඔබවත්ත පාරට හරස් පාර, මාදිවෙල, කෝට්ටේ

විටාවෙල් (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2014 ජූලි මස 02 වැනි දින.

07-469

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් සංස්ථාපනය කළ බවට දැන්වීමයි.

සමාගමේ නම : ද වර්ල්ඩ්සිලෝන් පබ්ලිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 99282
ලියාපදිංචි ලිපිනය : "හස්තකපානි" ශිරීල්ඩ් එස්ටේට්, මාවතගම, කුරුණෑගල
ලියාපදිංචි කළ දිනය : 2014.06.24

එම්. පී. ආර්. ප්‍රනාන්දු,
සමාගම් ලේකම්.

07-471

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : PETTAH MALL INTERNATIONAL (PVT) LTD
සංස්ථාගත කළ දිනය : 2013 ජූලි මස 5 වැනි දින
සමාගමේ අංකය : PV 93164
ලියාපදිංචි ලිපිනය :118, දෙවන හරස් වීදිය, කොළඹ 11.

මණ්ඩලයේ අණ පරිදි,

07-472

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

සමාගමේ නම : එස් එල් ප්‍රොෆෙෂනල් ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 99295
සංස්ථාගත කළ දිනය : 2014.06.24
ලියාපදිංචි කාර්යාලය : අංක 175/සී 3, ගංගාරාම පාර, කෝවින්න, කටුනායක.

සමාගම් ලේකම්.

07-475

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : ජෝලංකා රිසෝට්ස් (පීවීටී) එල්ටීඩී
2. අංකය : පී වී 99296
3. ලියාපදිංචි කළ දිනය : 2014.06.24
4. ලියාපදිංචි ලිපිනය : අංක 94, පාමංකඩ පාර, කිරුළපන, කොළඹ 06.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
සමාගම් ලේකම්.

ජෝලංකා රිසෝට්ස් (පීවීටී) එල්ටීඩී,
නීතිඥ සමාගමේ ලේකම්.

07-484

**සංස්ථාගත කිරීම පිළිබඳ නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (01) වගන්තිය ප්‍රකාර සංස්ථාගත කිරීම් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි.

ජෝර්ජ් ස්ටුවර්ට් කැපිටල් (පීවීටී) එල්ටීඩී නමින් නව සමාගමක් 2014 ජුනි මස 10 වැනි දින සිට සංස්ථාගත කරන ලද බව මෙයින් ප්‍රසිද්ධියේ දන්වා සිටිමු.

සමාගමේ නම : ජෝර්ජ් ස්ටුවර්ට් කැපිටල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 99059
සම සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 94 ඒ, ධර්මපාල මාවත, කොළඹ 07

සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම,
(නව සමාගම් සඳහා ලේකම්වරු)

ස්ටුවට් හවුස්,
අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01.

07-520

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බොරලැස්ගමුව, දිවුල්පිටිය, සූරියමල් මාවත, අංක 66/16 ඩී දරන ස්ථානයේ පදිංචි තේනුවර ආචාරිගේ රසික විරාජ් ද සිල්වා වන මම ප්‍රසිද්ධ නොතාරිස් සුමිත්‍රා වෛද්‍යසේකර මහතා විසින් 2013ක් වූ අප්‍රේල් මස 19 වැනි දින සකස් කරන ලද අංක 155 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී දෙහිවල, පීරිස් පෙදෙස, අංක 1/1 දරන ස්ථානයේ පදිංචි තුසිත් උඩවත්ත මහතා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් අහෝසිකර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බලකරු විසින් සිදුකරන ලද කිසිදු ගණුදෙනුවකට මින් ඉදිරියේ දී මා විසින් වග නොකියන බවටත් සමාජවාදී ජනරජයටත් පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තේනුවර ආචාරිගේ රසික විරාජ් ද සිල්වා.

07-522

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතන සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කර ගැනීම සඳහා වන දැන්වීමයි.

සමාගමේ නම : ආවර්ථ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98807
ලියාපදිංචි දිනය : 2014.05.28
ලියාපදිංචි ලිපිනය : කන්දහේන එස්ටේට්, ගාණේමුල්ල, මුද්දරගම.

සමාගමේ නම : ට්‍රයිඩන් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98798
ලියාපදිංචි දිනය : 2014.05.28
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

සමාගමේ නම : සයුරි මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98952
ලියාපදිංචි දිනය : 2014.06.05
ලියාපදිංචි ලිපිනය : අංක 90/10, වාසනාවත්ත, මෙත්තේගොඩ, පොල්ගස්ඕවිට.

ඩබ්. එස්. වීරමන්,
සමාගමේ ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල.

07-523

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

අංක 92, නාලවලාන ගෝනවිල පදිංචි වෛද්‍යතිලක මුණිගේ නිශාන් සංජීව සිල්වා වන මම ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. නයෝමි සේනානායක විසින් කෙටුම්පත් කර රෝමයේ ශ්‍රී ලංකා තානාපති ඉදිරියේ අත්සන් කරන ලද විදේශ ඇටර්නි බලපත්‍රය මගින් ඇටර්නි බලකරු ලෙස අංක 18/බී අක්කර 21 දෙමටපිටිය ලුණුවිල පදිංචි ගනේගොඩගේ රොහාන් ක්‍රිෂාන්ත පෙරේරා යන අයට ලබා දී තිබූ අයිතිවාසිකම් බලපුළුවන්කාරකම් සහ බලතල 2014.04.24 වැනි දින පටන් බල රහිත හා ශූන්‍ය කරන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඩබ්. එම්. නිශාන් සංජීව සිල්වා.

2014 ජුනි මස 04 වැනි දින.

07-548

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සරුබිම ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2014.06.20
සමාගමේ අංකය : පී. වී. 99200
ලියාපදිංචි කාර්යාලය : අංක 112/ඒ 1, ජයන්ති මාවත, පමුණුගම, අළුබෝමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්ලිව්. එස්. ප්‍රනාන්දු,
සමාගමේ ලේකම්.

07-549

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (01) වගන්තිය ප්‍රකාර ප්‍රසිද්ධ දැන්වීමයි

| *ආයතනයේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි ලිපිනය* |
|---|---|---|
| ඇක්වා ජෙම් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 96965 | අංක 38/බී, සුබද්‍රාරාම පාර, මකුළුව, ගාල්ල |
| ග්ලෝරියා ග්‍රෑන්ඩ් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 97056 | "නන්දන" මීපාවල, පෝද්දල, ගාල්ල |
| ක්‍රීන්ද කන්ද (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 97020 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |
| එම් එස් එම් එන් ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 97490 | අංක 36, දෙවන පටුමග, කටුගොඩ, ගාල්ල |
| රස්සාක් ජේම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 97926 | අංක 220/3, බෝපේ පාර, පියදිගම, ගිංතොට, ගාල්ල |
| ගෝල් ඉන්සයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98259 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |
| ඩිමැක් විලා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98475 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |
| බී ආර් ජෙම් ඇන්ඩ් ජුවෙලරි (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98900 | අංක 15, පල්ලිය පාර, බේරුවල |
| එෆ්. ඒ. ඩී. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98745 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |
| ලංකාලෑන්ඩ් බැක්පැකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99235 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |
| ලාභ් බිස්නස් ප්‍රොසෙසිං (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99078 | අංක 4, ද අල්විස් චතුරශ්‍රය, ගල්කිස්ස |
| ලිඕවා ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99087 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |
| සුන්ඩිඕ ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 99253 | අංක 77, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල |

එම්. එන්. ඇසෝසියේට්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

51, තුන්වැනි පටුමග,
කටුගොඩ,
ගාල්ල.

07-550

---

## දැන්වීමයි

බ්‍රැන්ඩික්ස් එක්ස්ප්‍රෙෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 61188) සහ බ්‍රැන්ඩික්ස් ඇපරල් සොලුයුෂන්ස් ලිමිටඩ් (පී බී 185) සමග ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 244 (3) ප්‍රකාර ඉහත කී සමාගම් එකම නෛතික ආයතනයක් බවට පත් වී ඇති බැවින්, 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 244 (1) (ඒ) ප්‍රකාර මෙම ඒකාබද්ධ කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් විසින් 2014 ජුනි මස 06 වැනි දින ඒකාබද්ධ කිරීමේ බලපත්‍රය නිකුත් කරන ලදී.

ඒකාබද්ධිත සමාගම් නාමය : බ්‍රැන්ඩික්ස් ඇපරල් සොලුයුෂන්ස් ලිමිටඩ් (පී බී 185)

ලියාපදිංචි කාර්යාලය : අංක 409, 3 වැනි මහල, ගාලු පාර, කොළඹ 03.

සමාගම් අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

07-555

---

## තැප්‍රොබානා ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

(ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම)

සමාගමේ ලියාපදිංචි අංකය පී වී 2714

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඇවරකරු පත්කිරීමේ දැන්වීම

2014 ජුනි මස 30 වැනි දින කොළඹ 10, (ඩාලි පාර), ටී. බී. ජයා මාවත, අංක 311, දරන ස්ථානයේ පිහිටි තැප්‍රොබානා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් හි පැවති ණය හිමියන්ගේ රැස්වීමේ දී, කොළඹ 04, කාසල් පටුමගේ අංක 02, හතරවන මහල එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස්හි හවුල්කරු සහ වරලත් ගණකාධිකාරී වන ජී. ජේ. ඩේවිඩ් ඇවරකරු වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. ජේ. ඩේවිඩ්,
ඇවරකරු,
තැප්‍රොබානා ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 ජූලි මස 03 වැනි දින,
එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්,
4 වන මහල, අංක 02, කාසල් පටුමග,
කොළඹ 04.

07-558/1

## තැප්‍රොබානා ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පී වී 2714

2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2014 ජුනි මස 30 වැනි දින සම්මත වූ ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ විශේෂ යෝජනාව.

සමාගම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 333 වැනි වගන්තිය යටතේ පැවති ණයහිමියන්ගේ රැස්වීමේ දී ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට සම්මත කරන ලදී.

එච්. වයි. ගැලලි,
සභාපති.

07-558/2

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 17
සමාගමේ නම : සිල්වර්ලයින් ට්‍රාන්ස්පෝටර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 96065
ලියාපදිංචි කාර්යාලය : අංක 176, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ.

ආරියපාල බෙත්මගේ,
ලේකම්වරු.

07-561

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : එන්කවුන්ටර්ස් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 96585
සංස්ථාගත කළ දිනය : 2014 ජනවාරි මස 20 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 20/63, ෆෙයා ෆීල්ඩ් ගාර්ඩන්, කොළඹ 08.

ටුවාන් හජ්රීන් ජුහාරා,
සමාගම් ලේකම්.

07-562

---

## සමාගමක් සංස්ථාගත කළ බව දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : ප්‍රිව්ටෙක්ස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 3 - 3/1, දුම්රිය පොළ පාර, කොළඹ 03
සමාගම් අංකය : පී වී 98412
සංස්ථාගත කළ දිනය : 2014 ජුනි මස 19 වැනි දින

CAS කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-576

---

## සමාගමක් සංස්ථාගත කළ බව දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කළ වගයි.

සමාගම් නාමය : කොකෝවර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 235, පුත්තලම පාර, වාරියපොල
සමාගම් අංකය : පී වී 98244
සංස්ථාගත කළ දිනය : 2014 අප්‍රේල් මස 23 වැනි දින

CAS කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-577

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) උපවගන්තියේ නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සිලෝන් ඩිජිටල් ට්‍රේඩින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 98193
ලියාපදිංචි දිනය : 2014 අප්‍රේල් මස 21 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 121, පහලවෙල පාර, බත්තරමුල්ල.

සමාගමේ ලේකම්.

07-585

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෝට්ටේ, කෝට්ටේ පාර, අංක 653/4ඒ, හි පදිංචි සිරිසේන කන්නංගර විජේතුංග වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. ඩී. අනුෂා එච්. රණසිංහ පෙරේරා විසින් වර්ෂ 2010 ජූලි මස 29 වැනි දින ලියා සහතික කරන ලද අංක 434 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කෝට්ටේ, කෝට්ටේ පාර, අංක 653/4ඒ, හි පදිංචි බෙන්තරගේ චාන්දනී මල්කාන්ති අල්විස් යන අයට බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍ර පොතේ 58 වන කාණ්ඩයේ 59 වන පත්‍රිරුවේ දිනපොතේ අංක 6376 හා වර්ෂ 2010.10.07 දාතම

යටතේ ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2014 ජූලි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට එකී ඇටෝර්නි බලකරු බෙන්තරගේ චාන්දනී මල්කාන්ති අල්විස් විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග කියනු නොලැබෙන පරිදි අහෝසි කොට අවලංගු කර සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ලංකාවාසී ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සිරිසේන කන්නංගර විජේතුංග.

2014 ජූලි මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-590

### ඇටර්නිබලය අවලංගු කිරීම

අංගොඩ ගොතටුව ගොඩවෙල අංක 269/10 හි පදිංචි ගල්සේනගේ සංජය අරුණ කුමාර ද අල්විස් (ජා. හැ. අංක 713333050 V) වන මවිසින් ලියා අත්සන් කොට කිරිදිවැල දියවාල අංක 138 හි පදිංචි ගල්හේනගේ මංජුලා (ජා. හැ. අංක 797252662 V) වෙත පැවරූ එස්. බී. කරුණාරත්න ප්‍රසිද්ධ නොතාරිස්තැනගේ අංක 575 සහ 2013.08.04 වැනි දින දරන ඇටර්නි බලය අවලංගු කරන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. එස්. ඒ. කේ. ද අල්විස්.

07-591

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයක ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එස්. එම්. විජේතුංග සහ ඩබ්ලිව්. ඊ. එල්. වයි. චාන්දනී නොහොත් ඩබ්ලිව්. වයි. සී. ඊ. ලියනගේ
ගිණුම් අංක : 0026 5001 6613

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.03.25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහසයලක්ෂ දහඅට දහස් හත්සිය විසිතුනයි ශත දහයක (රු. 16,18,723.10) මුදල ද, 2010 පෙබරවාරි මස 09 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහහතර ලක්ෂ හැට අට දහස් හයසිය හැත්තෑනමයයි ශත අනූ එකක (රු. 14,68,679.91) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.10.15 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.10.05 වැනි දින "දිවයින" "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.08.06 වැනි දින ප. ව. 2.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ උතුරු කළුතර තොටමුණේ කළුතර දෙබැද්දේ කළුතර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පාලතොට පිහිටි "මිල්ලගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. පී. ඒ. ජයවික්‍රම යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 13 දාතම හා අංක 11151 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 3 ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 425 දරන පිඹුරේ ලොට් 31 (අඩි 10 පළල පාර), නැගෙනහිරට : අංක 425 දරන පිඹුරේ ලොට් 30 (පාර), දකුණට : අංක 425 දරන පිඹුරේ ලොට් 30 සහ බස්නාහිරට : එස්. සමරනායක යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම අංක 425 දරන පිඹුරේ ලොට් අංක 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතරක් (අක්. 0 රූ. 0 පර්. 16.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 11151 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව ජී 425/266 යටතේ කළුතර ඉඩම් ලියපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 3 ඒ පහත සඳහන් නැවත මිනුමකි. -

එකී කළුතර දෙබැද්දේ පාලතොට පිහිටි "මිල්ලගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සිරි බොපෙ ආරච්චි යන අය විසින් සාදන ලද 1988 අගෝස්තු මස 21 දාතම හා අංක 425 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා ර්ණය කොට ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 31 නැගෙනහිරට : ලොට් 30, දකුණට : ලොට් 30 සහ බස්නාහිරට : ලොට් 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතරක් (අක්. 0 රූ. 0 පර්. 16.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 425 දරන පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

07-574/1

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සී. එස්. පී. චන්ද්‍රසේකර.
ගිණුම් අංක : 1013 5325 2028.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.10.21 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිඅට ලක්ෂ අනූඅට දහස් තුන්සිය හැත්තෑ පහයි ශත පහළවක (රු. 28,98,375.15) මුදල ද, 2010 සැප්තැම්බර් මස 02 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිඅට ලක්ෂ හැත්තෑහය දහස් නමසිය හැටතුනයි ශත තිස්නමයක (රු. 28,76,963.39) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2011.07.22 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2011.07.06 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.08.06 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ පතිරගොඩ පිහිටි ජනතා මාවත වරිපනම් අංක 103 දරන "පැලැන්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඒ. ජයරත්න යන අය විසින් සාදන ලද 2007 ජනවාරි මස 13 දාතම හා අංක 5396 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් ඒ2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ආර් 1 (අඩි 15 පළල පාර) නැගෙනහිරට : ජනතා මාවත, දකුණට : ලොට් ඒ1 සහ බස්නාහිරට : ලොට් ඒ හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0, රූඩ්. 0, පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 5396 දරන පිඹුරට අනුවය.

එකී ලොට් ඒ2 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

